ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව 2010

-----------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව,ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 01 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කල අතර නැවත සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2011 සැප්තැම්බර් 23 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලදි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2010 අගෝස්තු 06 දින ලංකා බැංකුවේ ආයෝජනය කර තිබූ රු.5,722,200 කට අදාල රු.181,203 ක් වූ ලැබිය යුතු පොලිය ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) රු.14,500,000 ක් වූ ආයෝජන සඳහා ලැබිය යුතු පොලිය ගිණුම්ගත කිරීමේදී රු.130,500 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා විදුලි ගාස්තු රු.91,672 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුල ඉඩමක් විකිණීමෙන් ලැබී තිබූ රු. 2,343,665 ක් වූ මුදල ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබූ අතර, ඉඩම විකිණීමෙන් සිදුවූ ලාභය හෝ පාඩුව හඳුනාගෙන ගිණුම් වලට ගලපා නොතිබුණි.

1.2.3 නොසැසදුනු පාලන ගිණුම්

-------------------------------

ගිණුම් අනුව ශේෂය හා උපලේඛන අනුව ශේෂය සැසදීමේදී ගිණුම් 2ක් යටතේ එකතුව රු.15,075,113ක් ඉක්මවූ ශේෂයක් ගිණුම් අනුව පැවතුණි. වැට් පාලන ගිණුම අනුව ශේෂයට වඩා උපලේඛන අනුව ශේෂය රු.1,723,668 ක් වැඩියෙන් දැක්වුණු අතර, ඒකල ගබඩාවේ භෞතික සමීක්ෂණ වාර්තා අනුව තොගයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශන අනුව ඒකල ගබඩාවේ තොගයේ වටිනාකමට වඩා රු.4,683,185 ක් වැඩියෙන් තිබුණි.

1.2.4 අවිනිශ්චිත ගිණුම්

---------------------

පහත කරුණු නර්ක්ෂණය විය.

(අ) වසර 21 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින හදුනා නොගත් රු.211,965 ක් වූ ශේෂ අවිනිශ්චිත ගිණුම් ශේෂයක් ලෙස දක්වා තිබුණි.

(ආ) 2007 වර්ෂයේ හදුනාගත් මුදල් වංචාවකට අදාල වූ රු.111,809 ක් නිරවුල් නොකරන ලද අවිනිශ්චිත ගිණුම් ශේෂය තුල ඇතුලත්ව තිබුණි.

(ඇ) 2009 වර්ෂය තුල අලෙවි විධායකයකු විසින් නිරවුල් නොකරන ලද රු.5,713,250 ක් අවිනිශ්චිත ගිණුම් ශේෂයක් ලෙස ගිණුම් වල දක්වා තිබුණි.

1.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සංස්ථාව දේශීය වශයෙන් ලබාදුන් දැන්වීම් වෙනුවෙන් 2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුදල රු.116,247,849 ක් වූ අතර, ඉන් රුපියල් 14,126,933 ක් වසර 10කට පෙර ලබාදුන් දැන්වීම් වෙනුවෙන් විය. මෙම මුදල් අයකර ගැනීම අවිනිශ්චිතව පවතී.

(ආ) විදේශීය දැන්වීම් වෙනුවෙන් 2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල රු.79,955,611 ක විය. ඉන් රු.1,400,280 ක් 1974 ට පෙර ලබාදුන් දැන්වීම් වෙනුවෙන් වූ අතර රු.46,269,590 ක් 1974 - 1999 අතර කාලය තුල ලබාදුන් දැන්වීම් වෙනුවෙන් විය. මෙම මුදල් අයකර ගැනීම සඳහා කිසිදු පයවරක් ගෙන නොතිබුණි.

(ඇ) ලක්හඩ ගුවන් විදුලිය සමහ පවත්වාගෙන ගිය ජංගම ගිණුමේ රු. 12,807,862 ක හර ශේෂයක් 2004 වර්ෂයේ සිට පැවති අතර එම ශේෂය අයකර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ඈ) 2007 වර්ෂයේදී තීන්දුව ලබාදුන්, නඩුවක් සම්බන්ධයෙන් 2005 වර්ෂයේදී තැන්පත් කරන ලද රු.350,000 ක මුදල 2011 ජූනි 10 දින දක්වාම නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) භාණ්ඩ හා සේවා බදු පාලන ගිණුමේ හා තැපැල්පති වෙනුවෙන් වූ ජංගම ගිණුමේ පිළිවෙලින් රු.109,575 ක් හා 195,700 ක හර ශේෂයන අයකර ගැනීමකින් තොරව 2001 වර්ෂයේ සිට ඉදිරියට ගෙන යමින් තිබුණි.

(ඊ) ජාතික ආරක්ෂක භාරය වෙත ගෙවිය යුතු රු.15,007,806 ක් 2006 වර්ෂයේ සිට නිරවුල් නොකර ඉදිරියට ගෙන යමින් පැවතුණි.

1.2.6 විගණනය සඳහා සාක්ෂි ඉදිරිපත් නොවීම

---------------------------------------------

පහත සඳහන් විෂයයන්ට අදාල ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවුණි.

(අ) මුළු වටිනාකම රු.2,207,844 ක්වූ ගෙවු වවුචර් 57 ක් .

(ආ) මාසිකව රු.25,000 බැගින් දීමනා ගෙවීමේ පදනම මත බඳවාගෙන තිබූ විශ්‍රාමික නිලධාරීන් 27 දෙනාට අදාල කාර්ය සාධන පිළබඳ වාර්තා.

(ඇ) ප්‍රධාන කාර්යාලයේ තොග වටිනාකම රු.16,760,407 වන අතර එයට අදාල භෞතික සමීක්ෂණය නිසි පරිදි සිදුකර නොතිබූ බැවින්, තොග වටිනාකම භෞතිකව සනාථකර නොතිබීම.

1.2.7 නීති, රීති, රෙගුලාස හා කළමනාකරණ තීරණ වලට අනුකුල නොවීම

-----------------------------------------------------------------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකුල නොවීම් නිරීක්ෂණය විය.

| <u>නීති,රීති රෙගුලාසි ආදියට යොමුව</u> | <u>අනුකුල නොවීම</u> |
|---|---|
| (අ) <u>1971 අංක 38 දරන මුදල් පනත</u> 13 (2) වගන්තිය | 2004 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා විගණන ගාස්තු (බදු මුදල් සහිතව) වශයෙන් රු.4,240,047 ක් ගෙවා නොතිබුණි. |
| (ආ) <u>මුදල් රෙගුලාස</u> | |
| (i) මු.රෙ. 135 | ආදායම් එකතු කිරීම හා වියදම් දැරීම සම්බන්ධ අදාල නිලධාරීන් අතර මූල්‍ය බලතල පවරා නොතිබුණි. |
| (ii) මු.රෙ. 373 (1) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ප්‍රධාන කාර්යාලයට ප්‍රතිපූර්ණය කලයුතු වුවත් එදිනට ප්‍රතිපූර්ණය නොකල අග්‍රිම ගිණුම් ශේෂ එකතුව රු.607,055ක් විය. |
| (iii) මු.රෙ.880 | මුදල් හෝ බඩු බාහිරාදිය භාර නිලධාරීන් විසින් ප්‍රමාණවත් ඇප තැබිය යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණු අවස්ථා විය. |

| | |
|---|---|
| (iv) මු.රෙ.1646 | ධාවන සටහන් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (ඈ) <u>ආයතන සංග්‍රහයේ xix පරිච්ඡේදය</u> | |
| (i) 5.2.1 ජේදය | රජයේ නිවාස කුලියට දීමේදී රජයේ නිලධාරීන්ගේ වැටුපෙන් 12 1/2% ක කුලියක් අයකල යුතු වුවත් මහනුවර අරුප්පල පිහිටි දෙමහල් නිවස නිලධාරීන් දෙදෙනෙකුට මාසිකව රු.100 සහ 125 බැගින් කුලියට දී තිබුණි. |
| (ii) 6.14 සහ 7 ජේද | විශ්‍රාම ගිය නිලධරියකු රජයේ නිල නිවාස වලින් ඉවත් කිරීමට කටයුතු කල යුතු වුවත් අරුප්පල පිහිටි රජයේ නිල නිවාසයේ පදිංචි විශ්‍රාම ගිය නිලධාරීන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) <u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ</u> | |
| (i) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 | එක් එක් වාහනයේ ඉන්ධන දහනය පිළිබඳව මාස 06 කට වරක් පරීක්ෂා කලයුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (ii) 1999 ඔක්තෝබර් 8 දින හා අංක 22/99 හි 1.1.6 සහ 2.2.6 වගන්ති | අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව නිලධාරීන් තිදෙනෙකු සඳහා වාහන තුනක් වෙන්කර තිබුණි. |
| (ඉ) <u>2002 නොවැම්බර් 28 දින හා අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය</u> | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි. |
| (ඊ) <u>2003 ජූනි 02 දින හා අංක පීඊඩී12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය</u> | |
| (i) 5.1.3 වගන්තිය සහ 2007 දෙසැම්බර් 18 දිනැති පීඊඩී 47 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සංයුක්ත සැලැස්මේ යාවත්කාලීන කරන ලද පිටපත් හා අයවැය ලේඛනයෙහි පිටපත් මුදල් වර්ෂය ආරම්භවීමට දින 15කට පෙර අදාල අංශ වෙත ඉදිරිපත් කළයුතු වුවත්, එසේ නියමිත කාලය තුල ඉදිරිපත්කර නොතිබුණි. |
| (ii) 6.5.3 | 2009 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |
| (iii) 8.3.2 | දිරිදීමනා හා ප්‍රසාද දීමනා වලට හිමිකම් නොමැති වුවද ඊට පටහැනිව සංස්ථාවේ සභාපති වෙත රු.10,000 ක මුදලක් ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (උ) 2010 දෙසැම්බර් 14 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 42හි 2 ඡේදය | ආයතනයේ සිටින සේවකයින් සංඛ්‍යාව 839 ක් වන අතර පැමිණීම පදනම් කරගෙන මාසිකව දිරි දීමනා ලෙස 2010 වර්ෂයේදී රු.7,376,982 ක් ගෙවා තිබියදී ඉහත දිරි දීමනාවට අමතරව චක්‍රලේඛයට අනුව ගෙවිය හැකි ප්‍රසාද මුදල රු.7,500ක් වුවත්, රු.10,000 ක උපරිමයකට යටත්ව ප්‍රසාද මුදල් ලෙස රු.8,011,500 ක් ගෙවා තිබුණි. මේ සඳහා භාණ්ඩාගාර අනුමැතිය 2011 ජූනි 06 දින වන විටත් ලබාගෙන නොතිබුණි. |

02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය
-------------------------------------

2.1 මූල්‍ය සමාලොචනය
----------------------

2.1.1 මූල්‍ය ප්‍රතිඵල
-----------------

(අ) සංස්ථාවේ සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.38,020,869 ක බදු පූර්ව ලාභයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ලාභය රු.108,579,655 ක් වූයෙන් බදු පූර්ව ලාභයෙහි රු.70,558,786 ක අඩුවීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයෙ මූල්‍ය ප්‍රතිඵල කෙරෙහි පහත කරුණු ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(i) පුනරාවර්තන වියදම් සඳහා පුද්ගල පඩිනඩි යටතේ භාණ්ඩාගාරයෙන් ලබාදුන් ප්‍රදාන මුදල රු. 150,000,000 ක් වූ අතර, එය මුළු ආදායමෙන් 18.21% ක් විය.

(ii) ජපාන රජයෙන් ලද වත්කම් ප්‍රදාන වටිනාකම නිරූපණය වන බැර ශේෂය කපාහැරීම වාර්ෂික ආදායම් ප්‍රවේශයට අනුව ගිණුම් තැබීම නිසා බැර කල රු. 7,276,869 ක් ද ශ්‍රී ලංකා රජයෙන් 1999 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ලද ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකමින් 2010 වර්ෂයට අදාලව (ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 24 අනුව) රු.86,175,572 ක් ආදායමට හඳුනාගැනීම යන බැර ශේෂයන්ගේ එකතුව රු.93,452,441 ක් සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් නොවන ආදායම තුල ඇතුලත් වීම.

(ආ) මූල්‍ය ප්‍රකාශණ නැවත ප්‍රකාශ කිරීම නිසා රු.38,283,331 ක් වූ 2009 වර්ෂය සඳහා පෙර පැවති ලාභය රු.108,579,655 ක් දක්වා වැඩිවී ඇත.

2.2 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

2.2.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වර්ෂය තුළදී අනුමත බැංකු අයිරා සීමාව වන රු.මි. 30 ඉක්මවා වරින් වර මාස 07 ක් තුල රු.337,966 සිට රු.558,106 දක්වා පරාසයක් තුල එකතුව රු.23,659,461 වන ලෙස අයිරා පහසුකම් ලබාගෙන තිබුණි. මෙය සිරිතක් වශයෙන් පවතින අතර මෙම තත්වය මගහරවා ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් කළමනාකරණය විසින් සකසා නොතිබුණි.

(ආ) පාරිතෝෂිත ගෙවීම සඳහා 2010 දෙසැම්බර් 31 දින දක්වා වෙන්කර තිබූ රු. 154,469,646 ක්වූ මුදල ආයෝජනය කර නොතිබුණි .

(ඇ) සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාල ජංගම ගිණුම් 8ක 2010 දෙසැම්බර් 31 දිනට වාසිදායක ශේෂය රු.14,309,597 ක් වූ අතර බැංකු අයිරා පහසුකම් ලබාගන්නා ජංගම ගිණුමේ එදිනට අවාසිදායක ශේෂය රු.4,171,827 ක් විය. විධිමත් මූල්‍ය කළමනාකරණයකින් කටයුතු කිරීමට හැකි වූයේ නම් සමාලෝචිත වර්ෂය තුල බැංකුව අයකර තිබූ රු.5,847,394 ක්වූ අයිරා පොලිය අවම කරගැනීමට හැකිව තිබුණි.

2.2.2 හඳුනාගන්නා ලද පාඩු

--------------------------

පහත කරුණ නිරීක්ෂණය විය.

(අ) නියමිත දිනට පෙර විදුලි බිල්පත් නොගෙවීම නිසා 2010 වර්ෂයේ මුල් අර්ධ වර්ෂය තුල විදුලිබල මණ්ඩලයට රු.433,672 ක මුදලක් අධිභාර වශයෙන් ගෙවා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි ආපන ශාලාව 2010 වර්ෂය සඳහා බදු දීමට ටෙන්ඩර් කැඳවා තිබූ නමුත් සුදුසුකම් ලත් ටෙන්ඩර්කරුවන් තෝරා නොගෙන 2009 වර්ෂය තුල ආපනශාලාව පවත්වාගෙන ගිය කළමනාකරු වෙත ඉදිරියටත් කටයුතු කරන ලෙස වාචිකව දන්වා තිබුණි. මෙම ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා ගොඩනැගිල්ල, ජලය හා විදුලිය නොමිලේ ලබාදී තිබූ අතර ගෑස් සඳහාද මසකට රු.35,000 දක්වා සංස්ථාව වියදම් කර තිබුණි. සංස්ථාව විසින් සපයා තිබූ ජලය හා විදුලිය සඳහා වෙනම මීටර් සවිකර නොතිබූ බැවින් ඒ සඳහා වැය වන බිල්පත් ගණනය කිරීමට විගණනයේදී නොහැකි විය.තවද මේ සඳහා අපනශාලා බදුකරු සමග ගිවිසුමකට එළඹ නොතිබුණ අතර 2009 හා 2010 වර්ෂ වෙනුවෙන් කිසිදු බදු ආදායමක් අයකරගෙන නොතිබුණි.

(ඇ) සංස්ථාව විසින් 2008 ජුනි මසට අදාළ සේවක අර්ථසාධක අරමුදලේ දායකය වූ රු.4,848,276 ක් නියමිත දිනට ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් ඒ සඳහා අධිභාර වශයෙන් රු.1,939,310 ක් ගෙවා තිබුණි.

2.2.3 ආර්ථික නොවූ ගනුදෙනු

----------------------------

1993 අප්‍රේල් මස 23 දිනැති සංස්ථා මණ්ඩල පත්‍රිකාව අනුව රුපියල් ලක්ෂ 10 ක මුදලක් සීමා සහිත ලංකා පුවත් ආයතනයේ ආයෝජනය කර ඇත. මෙම වටිනාකම 1993 සිට අවසන් ගිණුම් තුල ආයෝජන ලෙස ඉදිරිපත් කර ඇතත් මෙතෙක් කිසිදු ආයොජන ආදායමක් ලැබී නැති අතර, ආයෝජන මුදල හෝ ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 නිෂ්කාර්ය හා ඌන උපයෝජන වත්කම්

-------------------------------------------

ප්‍රාදේශීය විකාශනාගාර හා ප්‍රාදේශීය සේවා සතු පහත සඳහන් වත්කම් නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවතුනි.

| | <u>ප්‍රාදේශීය විකාශනාගාරය/සේවය</u> | <u>නිෂ්ක්‍රිය හා ඌන උපයෝජනව පැවති වත්කම් වර්ගය</u> |
|---|---|---|
| (i) | රුහුණු සේවය | කාර්යාල කටයුතු හා විකාශන මැදිරි සඳහා වර්ග අඩි 5000 ට වැඩි ගොඩනැගිල්ලක් වෙන්කර තිබූ නමුත් ඉන් වර්ග අඩි 2000 ක් පමණක් භාවිතයට ගෙන තිබුණි. |
| (ii) | දෙනියාය විකාශනාගාරය | ඉන්ධන ලීටර් 5000 ත් 6000 ත් අතර ප්‍රමාණයක් ගබඩා කල හැකි ඉන්ධන ටැංකියක් වසර 10 ක සිට නිෂ්කාර්යව පැවතුනි. |
| (iii) | කඳුරට සේවය | පර්චස් 19ක ඉඩමක පිහිටි අනිවත්ත දෙමහල් නිවාසය 2007 වර්ෂයේ සිට නිෂ්ක්‍රියව පැවතිනි. |
| (iv) | කොත්මලේ ප්‍රජා ගුවන් විදුලි සේවය | දොරගල පිහිටි ඉඩම හා වර්ග අඩි 4000 ක් පමණ වූ නිවස වසර 8 ක සිට නිෂ්කාර්යව පැවතුනි. |

2.2.5 කාර්‍ය්‍යය මණ්ඩල පිරිවැය

---------------------------

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 පරිදි මෙම සංස්ථාව සඳහා අනුමත සේවක සංඛ්‍යාව 528 ක් විය. (මෙය සංස්ථාව විසින් ප්‍රතික්ෂේප කොට සංශෝධනය කිරීමට යෝජනා කර ඇත.) නමුත් තත්‍ය ස්ථිර සේවක සංඛ්‍යාව 2010 දෙසැම්බර් 31 උනට 839 ක්ද, කැලි පදනම, තාවකාලික හා කොන්ත්‍රාත් පදනමේ සේවකයින් ගණන 53 ක්ද විය. ඊට අමතරව අලෙවි විධායක ලෙස කොන්ත්‍රාත් පදනමේ සේවකයින් 21කින්ද, සහන නිවේදකයින් ආසන්න ලෙස 77 දෙනෙකුගෙන්ද (ගෙවීම්/පැය ගණන හා දින අනුව ජූනි මස නියැදියට අනුව ගණනය කර ) සේවය ලබාගෙන තිබුණි.

2.2.6 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර සැලැස්ම
--------------------------------------------

(අ) <u>සංයුක්ත සැලැස්ම</u>

අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සංයුක්ත සැලැස්ම තුල අඩංගු වියයුතු ලක්ෂණ එනම් සංස්ථාව සතුව දැනට පවතින සම්පත් පිළිබඳ සටහන, සංවිධාන ව්‍යුහය,සංස්ථාව සතු ශක්තීන් හා දුර්වලතා,අවස්ථා හා තර්ජන පිළිබඳ විශ්ලේෂණය, පසුගිය වසර 03ක මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ විමර්ශනය හා කාර්යමණ්ඩල විස්තර, 2010-2014 වර්ෂ සඳහා පිළියෙල කල සංයුක්ත සැලැස්ම මගින් ආවරණය නොවීය.

(ආ) <u>ක්‍රියාකාර සැලැස්ම</u>

එම චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය ප්‍රකාරව පැහැදිලිව හඳුනාගත හැකි වන පරිදි ක්‍රියාකාර සැලැස්මේ සඳහන් කර ඇති කාර්යයන් සඳහා වගකීම් දරන නිලධාරීන් හඳුනාගෙන නොතිබුණි.තවද සිදුකිරීමට අපේක්ෂිත කාර්යයන් සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදනයන්ගේ ප්‍රමාණය ඇතැම් කාර්යයන් සඳහා පැහැදිලිව සඳහන් කර නොතිබුණි.

03. පද්ධති හා පාලන
-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතු වේ.

(අ) වාර්ෂික භාණ්ඩ හා තොග සමීක්ෂණ
(ආ) කාර්ය පැවරුම්
(ඇ) ගුවන් කාල විකුණුම් ආදායම අයකර ගැනීම
(ඈ) අයවැය
(ඉ) දිරිදීමනා ඇගයුම් ක්‍රමය
(ඊ) වාහන